# ඇරයුම

වෙළුම 01 | කලාපය 03 | ත්‍රෛ මාසිකය | ජූලි-අගෝස්තු-සැප්තැම්බර් 2012 | මිල 15/-

රමළාන් මාසය මනුෂ්‍ය වර්ගයාට මගපෙන්වීම හා (නිවැරදි මාර්ගය දක්වන) පැහැදිලි ඉගැන්වීම් වලින් යුක්ත හා (සත්‍ය හා අසත්‍යය තෝරාගැනීමේ) මිනුම් දණ්ඩද සැපයෙන කුර්ආනය පිරිනමන ලද මාසය වේ. එබැවින් මෙම මාසය ලබන කවරෙකු හෝ වේවා ඔහු එහි සවුම් (උපවාසය) ඉටුකළ යුතුය. එහෙත් යමෙකු අසනීපයෙන් පසුවේ නම් හෝ ගමනක යෙදී සිටින්නේ නම් හෝ ඔහු එම දින ගණනට සමාන දින ගණනක් වෙනත් දින වල කළ යුතුය. අල්ලාහ් නුඹලාට සහනයක් සැලැස්වීමට කැමතිය. නුඹලාට දුෂ්කරතාවක් ගෙන දීමට කැමති නොවේ.

**අල් කුර්ආන් 2:185**



ප්‍රකාශනය හා බෙදා හැරීම
ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදය(FRCS)
තැ.පෙ 1989, කොළඹ.
දු.අ: 0113 091 951
ඊමේල්: arayuma@yahoo.com



## සංස්කාරකගෙන්

**සංස්කාරක මණ්ඩලය**

අෂ්ෂෙයික් ලෆාරුල්ලා (බහ්ජි)

අෂ්ෂෙයික් කලීල් (මදනි)

එම් අජ්මල් රෆීක්

කුර්ෂිඩ් අහමඩ්

සෑම කෙනෙකුටම තමන්ගේ ආගම කිසිදු කරදරයකින් තොරව පිලිපැදීමට සුදුසු වාතාවරණයක් පවතින රටක්වන ශ්‍රී ලංකාව තුළ සියවස් ගණනාවක් සහජීවනයෙන් ජනතාව ජීවත් වන්නේය.

එහෙත් මෑතක සිට මෙම සාමකාමී වාතාවරණය අවුල් කර ආගම් අතර ගැටළු මතු වීමට සලස්වා එම ගැටළු ඔස්සේ තමන්ගේම න්‍යාය පත්‍රයක් සකස් කිරීමට සැඟවුණු ඇතැම් පිරිස් උත්සහ කරන බව දන්නෝ දනිති.

ඉතාමත් අන්‍යෝන්‍ය බැඳීමකින් ජීවත් වන ජනකොට්ඨශයන් දෙක අතර ගැටළු ඇති කර ඒ ඔස්සේ පූජණීය ස්ථාන කඩා බිඳ දමා නැවතත් රට තුළ කුරිරු යුද්ධයක් පටන් ගැන්මට තැත් කරන බවක් අපට වැටහෙන්නේය. ඉන්පසු මානව හිමිකම් යනුවෙන් පවසා රට තුළට ඇතුළු වීම සඳහා පහසුවෙන් දොර විවර කිරීමට කරන උත්සහයක් යැයි ද අපට සිතන්නට සිදුව ඇත්තේය.

මුස්ලිම් මස්ජිද් වලට පහර දීමෙන් මුස්ලිම් ජනයා උසිගන්වා ඒ ඔස්සේ ක්‍රෝධය වර්ධනය කර රට අස්ථාවර කිරීමට ද ඇතැම් බටහිර හිතවාදීන් උත්සහ කරන බවත් පෙනෙන්නට තිබේ. මේ වෙනුවෙන් පූජ්‍ය පක්ෂය යොදා ගැනීම කණගාටුදායකය.

රටක් සංවර්ධනය වීමට නම් එම රට තුළ සාමය හා සහජීවනය රජකළ යුතුය. එවිට මිනිසා ද සුවපත් වන්නේය. අස්ථාවර භාවයක් පවතිද්දී කෙසේ නම් රටක් දියුණු විය හැකි ද?

මුස්ලාම්වරුන්ට අසාධාරණයක් සිදුවෙද්දී ඒ වෙනුවෙන් සතුටු වීමට කොටසක් සිටින්නේය. ඊට හේතුව ලංකාවට එරෙහිව ජත්‍යන්තරය මානව හිමිකම් චෝදනාවක් බටහිර රටවල් ඉදරිපත් කළ අවස්ථාවේ ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් ඊට එක හඬින් විරුද්ධ වීමත් මුසලිම් රටවල් ගණනාවක් එම චෝදනාවට විරුද්ධව තම ඡන්දය පාවිච්චි කිරීමත් හේතුවෙනි.

මොනයම් ක්‍රියාමාර්ග මුස්ලිම්වරුන්ට එරෙහිව ක්‍රියාත්මක කළත් මුස්ලිම්වරුන් දිගින් දිගටම රට වෙනුවෙන්ම ඉදරිපත් වීමත් අන්‍යාගමිකයින් සමග සුහදව කටයුතු කිරීමත් කිසිවෙකුටත් වලක්වාලීමට නොහැකියග තමන් උපන් රටට ආදරය කිරීමත් සහජීවනයෙන් කටයුතු කිරීමත් ඉස්ලාම් දහමේ අතිශයින් තහවුරු කර ඇති කරුණකි.

මෙහිදී මුස්ලිම්වරුන්ගේ වගකීම වනුයේල ඉස්ලාම් දහම හා මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් ප්‍රචාරය වී ඇති වැරදි මත දුරුකිරීමට කටයුතු කිරීමයි.

අප අන්‍යෝන්‍ය බැඳීමකින් හා ආදරයෙන් මෛත්‍රියෙන් කටයුතු කළේ නම් මිනිසා සුවපත් කිරීමටත් රට ආශ්චර්යමත් රටක් වශයෙන් ආසියාව තුළම වැජඹීමටත් එතරම් අමාරු නොවනු ඇත.

අප රටක් වශයෙන් එකට සිටීමටත්, මිනිස් සිත් තුළ මෛත්‍රිය වර්ධනය වීමටත්, සහජීවනයෙන් හා ප්‍රේමයෙන් කටයුතු කිරීමටත්, ස්ථිර සාර සාමයක් රට තුළ පැවතීමටත් සර්ව බලධාරී අල්ලාහ් අපට මග පෙන්වනු මැනව.

මෙම සඟරාව සම්බන්ධයෙන් ඔබට ඇති අදහස් යෝජනා චෝදන සියල්ල අපට ලියා එවන්න. ඔබට ඉස්ලාම් දහම සම්බන්ධයෙන් නොමිලේ අධ්‍යාපනය හා පොත් පත් අවශ්‍ය වන්නේ නම් අපහා සම්බන්ධ වන්න. ඔබට ඉස්ලාම් දහම තුළ ඇති ගැටළු අප වෙත යොමු කරන්න. ඒ සඳහා ප.ව 12.00 සිට ප.ව1.00 දක්වා පහත දුරකතන අංක ඔස්සේ අමතන්න. පිළිතුරු දීම සඳහා අප ඇපකැප වී සිටින්නෙමු.

**දු.අ: 0115 690717**

ISSN 2012-905X

**Ayoon Optical**
Direct Importer & Wholesales Dealers in optical Goods, Frames, Lenses, Sunglass, Tools, Etc
No: 88, Market,
90/3, Prince Street
Colombo-11
city vision Tel: 0112454346
Mobile: 0778787989
PRADA LEVI'S GUCCI Ray-Ban

ඔබට අපගේ සඟරාව ඔස්සේ දැන්වීම් පළ කිරීමට අවශ්‍ය වන්නේ නම් අපට කතා කරන්න.
0113 091951

# අධ්‍යයනයට සූදානම් වෙමු.

මෙම මහා විශ්වය එක් දෙවියෙක් විසින් මවන ලද්දක් ද එසේ නැත්නම් ස්වභාවධර්මයාගේ ඇවෑමෙන් සිදුවූවක් ද යන්න බොහෝ විද්වතුන් අද වනතෙක් 100% ක් තහවුරු කරගෙන නොමැත. විශ්වයේ බිහිවීම සම්බන්ධයෙන් එක් එක් ආගමකට අයත් ජනයාට එක් එක් ආකාරයට අවබෝධයක් ලබා දී තිබෙන බැවින් එම කාරණා සාධාරණීකරනය කරගෙන එම තීන්දුවෙන්ම අවසානය දක්වාම සිටින්නේය. එහෙත් සතුන්ට වඩා දැනුමෙන් ඉතා පෝෂණය වී සිටින මිනිසා ඇතැම් විද්‍යාත්මක මතිමතාන්තර හේතුවෙන් මෙලොව ආරම්භය සම්බන්ධයෙන් සැළකිල්ලක් දක්වන්නේ නැතුව අයාලේ යන්නේය. ස්වභාවිකවම මෙලොවත් ග්‍රහවස්තූන් ඇතිව තිබේ නම් ඇයි සූර්‍යයා ඔස්සේ එළිය හා උෂ්ණත්වය පිටවිය යුත්තේ යන්න සිතා බැලිය යුතුය. පෘථිවිය භ්‍රමණය වෙමින් ඉර සමඟ පරිභ්‍රමණය වන්නේ ඇයි යන්නත් අප සිතා බැලිය යුතුය. පෘථිවියේ පමණක් මිනිසා ජීවත් විය හැකි පරිසරයක් ඇති වී ඇත්තේ කුමක් හෙයින් ද? මේ සියල්ල සංවිධානත්මක සිදුවෙමින් පවතින්නේ ඇයි? එම සැලැස්ම සකස් කළේ කවුරුන්ද ? යන්න අප කල්පනාකාරීව සොයාබැලිය යුතුය.

ස්වභාවධර්මයා යන එක් වචනයක් තියාගෙන මිනිසා ඒ මත පමණක් රැඳා පැවතිම නිසා මිනිසාගේ මේ මහා මැවුම් කරුවාව අමතක කර ඇත. එසේ නැත්නම් නොදැනුවත්වම සිටින්නේය. ඒ ආකාරයෙන්ම ජීවිතය ගෙන ගියේ නම් අයාලේ යන සතුන්ටත් නවීන ලෝකයේ ජීවත් වන අපටත් කිසිඳු වෙනසක් නොමැත. මිනිස් ජීවිතයට උචිත පරිදි, සූර්‍යයා හැඩ ගැසී සිටිය යුතුයි යන්නත් පෘථිවිය භ්‍රමණය විය යුතුයි යන්නත් ගෘහවස්තූන් ක්‍රියාත්මක විය යුතුයි යන්නත් ස්වභාවධර්මයා නොදන්නේය. එහෙත් මිනිසාට වඩා ශක්තිමත්, මිනිසාව මැවීමට ශක්තිය ඇති, මිනිසා පරිභෝජනය කරන මේ දේ සියල්ල මවා සියල්ල පාලනය කළ හැකි අසීමිත ශක්තියක් මෙන්ම අසීමිත ප්‍රේමයක් ඇති දෙවියාට පමණී මිනිසාට උචිත පරිදි සූර්‍යයාව හා චන්ද්‍රයාව මෙන්ම සුළං හා ජලය ආහාර සියල්ල හසුරුවන්නට හැකි වන්නේ. ස්වභාවධර්මයාට නිසියාකාරව නිර්වචනයක් පවා ලියන්නට නොදන්නා ජනතාව කෙසේ නම් කිසිදු තේරුමක් නැති එම වචනයට සියල්ල සංවිධානත්මකව ඉටුකළ හැකි යන්න විශ්වාස කරන්නේ? ස්වභාවික හා කෘතිම යන්නෙන් භාණ්ඩ බෙදන අප, මිනිසාට නිෂ්පාදනය කළ හැකි සියල්ලටම පවසන්නේ කෘතිම යන්නත් මිනිසාගේ ශක්තියට හා ඔහුගේ සීතීමට නොහැකි දේවල් වලට පවසන්නේ ස්භාවික යන්නයි. එහෙත් ගැඹුරින් හා විචාර බුද්ධියෙන් බලන විට අවබෝධ වන්නේ එක් පෑනක් වූවත් ස්භාවිකව හට ගැනීමට නොහැකි හේතුවක් පවතින නිසායි මිනිසා එය නිෂ්පාදනය කරන්නේ. මිනිසාට නිපදවිය නොහැකි වස්තූන් ඉබේම හට ගත්තා යන්න පැවසීම කෙතරම් විශ්මයජනක හා ප්‍රශ්නාර්ථයක් ගෙන දෙන කරුණක් ද? මිනිසාගේ ශක්තියට නොහැකි දේවල් සියල්ල එම මිනිසාව මැවූ දෙවියා මැවුවාය යන්නත් මිනිසාගේ ඕනෑ එපාකම් දන්නා එම දෙවියා මිනිසාගේ පරිභෝජනය සඳහා මෙලොවේ සියලු දේවල් මිනිසාට ලබා දී තිබෙන බවත් විශ්වාස කිරීමයි බුද්ධියට ගොචරවන්නේ. ස්වභාවිකව හට ගත් කිසිවක් නොමැත. පෑන නිපදවූයේ නම් එහි නිෂ්පාදකයා සිටිය යුතුමය. මේසය තිබෙන්නේ නම් එහි නිෂ්පාදකයා සිටිය යුතුමය. සූර්‍යයා චන්ද්‍රයා තිබෙන්නේ නම් එහි මැවුම් කරුවා සිටිය යුතු නොවේ ද?. මෙසේ විවෘත සිතකින් අධ්‍යයනය කළහොත් පමණී අපගේ බුද්ධිය නිසියාකාරයෙන් ක්‍රියාත්මක වීමට ආරම්භ වන්නේ. එසේ ක්‍රියාත්මක වූවන්ට අල් කුර්ආනය මෙසේ පවසන්නේය.

**ජනයිනි, උපමාවක් පෙන්වනු ලැබේ. එයට සවන් දෙනු. නියත වශයෙන් අල්ලාහ් හැර, නුඹලා අයැදින අයට මැස්සෙකුවත් නිර්මාණය කිරීමට නොහැක්කේමය, ඔවුන් සියලු දෙනා එයට එක් වූවද, තවද මැස්සා ඔවුන්ගෙන් යමක් පැහැර ගත්තේ ද උගෙන් එය මුදවා ගන්නටද ඔවුහු නොහැක්කෝය. නමදින්නා ද, නමදිනු ලබන්නාද දුර්වලය.**

**(අල් කුර්ආන්** 22:73)

**මෙය අල්ලාහ්ගේ මැවීමයි. ඔහු හැර අන් අය මැව්වේ මොනවා දැයි මට පෙන්වා දෙනු. නොඑසේය. අපරාධකාරයෝ ප්‍රකට නොමඟෙහිය (අල් කුර්ආන්** 31:11)

**ඔහු (අල්ලාහ්) ශුක්‍රාණු බිඳකින් මිනිසා මැවිය. දැන් ඔහු (මිනිසා) පැහැදිලිවම (අල්ලාහ්ට එරෙහිව) තර්ක කරන්නෙකු බවට පත්ව ඇත.(අල් කුර්ආන්** 16:3)

“මිනිසාගෙන් බොහෝ දෙනෙක් ස්වභාවධර්මයා යැයි කියාගත් සියල්ල “මමයි මැව්වේ” යන්න ධෛර්‍යයමත්ව ප්‍රකාශ කිරීමට සුදුස්සෙක් සිටින්නේය. නියත වශයෙන් මෙම මහ පොළොව ඉබේ ඇති වූවක් නොවේ. මෙය මවන ලද්දේ **අල්ලාහ්** විසින්මය. මෙය පිළිනොගන්නන්ට ද වැටහීමක් ඇතිව තිබිය දීත් එය නොපිළිගන්නා අයට ද අල් කුර්ආනය මෙසේ පවසයි.

**නියතවශයෙන් අල්ලාහ් කිසි ලෙසකින් මිනිසුනට අසාධාරණයක් නොකරයි. නමුත් මිනිසුන්මය තමන්ට අසාධාරණය කරගන්නේ.**

**(අල් කුර්ආන්** 10:44)



අබූ zසහරා

# නෝම්බි මාසයේ කෙළ ගිලින්නටත් බැරිලු - ඇත්ත ද?

මාතෘකාවේ තිබෙන කරුණ සම්බන්ධයෙන් මෙතෙක් කල් කියවන ඔබටත් යම් ගැටළුවක් තිබෙන්නට ඇති. "නෝම්බි" යනු කුමක් ද? ඇත්තටම කෙළ ගිලින්නටත් බැරිද? එහෙම ඉන්නට පුළුවන් ද?

ප්‍රඥාවේ උතුම් බව වනුයේ කරන යමක් නිවැරැදිව යහපත් ලෙස එයටම ආවේනික වූ විලසින් කිරීමය. මෙය ඇතැම් පිරිස් වටහා ගන්නේය. තවත් පිරිසකට නොතේරෙන්නේය.

"නෝම්බි"යනු "නෝන්බු" යන දමිළ භාෂාවෙන් සැදුම්ලත් වචනයකි. මුස්ලිම් ජනයාගෙන් බහුතරයක් දමිළ භාෂාව කථා කරන හෙයින් උපවාසය යන්නෙන් අර්ථය ගෙන දෙන "නෝන්බු" යන වචනය "නෝම්බි" යන්නෙන් සමාජ ගත වී ඇත. සිංහල භාෂාව මව්බස කරගත් අප "උපවාසය" යන වචනයම උපයෝගි කරමු.

මුස්ලිම් ජනයාට ද අනෙක් ජනයාට මෙන් මාස 12ක් තිබෙන්නේය. එයින් එකක් වන්නේ රමළාන් මාසයයි' මෙම මාසයේ උපවාසයේ යෙදීම මුස්ලිම්වරුන්ට අනිවාර්‍යය කටයුත්තකි. මෙය ලෝකයට අලුත් දෙයක් නොවන්නේය. ජේසුස් වහන්සේ දවස් හතලිහක් උපවාසයේ යෙදුණු බව බයිබලයේ සඳහන්ය. හින්දු භක්තිකයින් ද "විරදම්" නමින් උපවාසය රකිති. බෞද්ධ ධර්මයේ ද ඇතැම් ස්වාමීන් වහන්සේලා මධ්‍යහනයට පෙර ආහාර අනුභව කර පසු ආහාර නොගනිති.

එහෙත් මුස්ලිම්වරුන්ගේ උපවාසයත් අනිකුත් ආගමිකයින් රකිනා උපවාසයත් හාත්පසින්ම වෙනස්ය. එහෙත් ඊසා නබිතුමා රකිනා ලද උපවාසයේත් මුස්ලිම්වරුන් රකිනා උපවාසයේත් අල්ලාහ් පිළිබඳ බියබැති භාවය තිබුණේය.

අරුණෝදයට පෙර කාලයේ සිට ඉර බසින වේලාව දක්වා මුස්ලිම්වරුන් උපවාසය රකින්නෝය. මෙම කාල සීමාව තුළ නිරාහාරව, විවාහ වුවන් තමන්ගේ භාර්‍යාව සමඟ සංසර්ගයේ නොයෙදී ලිංගික ආශාව පාලනය කරගෙන පව්වලින් ඈත් වී යහපත් පරිසරයක් තමන්ට සලස්වාගෙන අල්ලාහ් වෙනුවෙන්ම කැපවී සිටින්නේය. මෙහිදී අප හොඳින් මතක තබා ගත යුතු කරුණක් තිබෙන්නේය. එනම් කෙළ ගිලින්නට තහනමක් ඉස්ලාම් දහම තුළ නොමැත. කෙළගිලීම සම්බන්ධයෙන් උපවාසයට හාත්පසින්ම වෙනස් වූ අදහසක් මුස්ලිම් නොවන සමාජ අතරට පිවිසියේ කෙසේ ද? මම නොදනිමි. රමළාන් මාසයේ උපවාසය යනු අල්ලාහ් පිළිබඳ වූ බිය බැතිමත් භාවය ප්‍රගුණ කිරීමෙහි ලා සැලකැල්ලක් දැක්වීම මිස කෙළ ගිලිනවා ද? නැද්ද? යන්න සොයා බැලීම් කළයුතු කාලය නොවේ. නියත වශයෙන්ම ජනයාට උපවාසය ලබා දීමේ සැබෑ පරමාර්ථය සම්බන්ධයෙන් ශුද්ධ වූ අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.



**විශ්වාසවන්තයින්, නුඹලාට පෙර සිටි (නබිවරුන්ගේ අනුගාමිකයින්) අය කෙරෙහි පවරනු ලැබූවාක් මෙන් නුඹලා කෙරෙහිද සව්ම් (උපවාසය) පවරා ඇත. මෙමගින් නුඹලාට (අල්ලාහ් කෙරෙහි) බිය බැතිමත් විය හැකිය.**

**(අල් කුර්ආන් 2:183)**

මුස්ලිම්වරුන් රකිනා උපවාසය දේව නැමදුමකි. එය චාරිත්‍රයක් නොවේ. එම උපවාසය ඔස්සේ ඔවුන්ගේ ගැලවුම ළඟා කරගත හැකිය.
මුස්ලිම්වරුන්ගේ උපවාසය එක්තරා විදිහක භාවනාවකි. ඒ ඔස්සේ මනස පාලනය කළ හැක.
මුස්ලිම්වරුන් උපවාස කාලය තුළ වතුර බිඳක්වත් නොගිලින්නේය. රසවත් ආහාර වේලක් ලඟ තිබුණත් නිරාහාරවම සිටින්නේය. ඒ ඔස්සේ ඔවුන් තණ්හාව ආශාව පාලනය කරන්නේය. මෙය අල්ලාහ් පිළිබඳ වූ බැතිමත් භාවයක් මිස වෙනකක් නොවන්නේය. මෙම බැතිමත් භාවය ඔස්සේ දවස් තිහක් හොඳ පන්නරයක් ලබා ගන්නේය. පෙර මාසවල කළ පාපක්‍රියාවන් නැවත මතක් කර ඒ වෙනුවෙන් පව්සමා අයැදින්නේය. ඉදිරි මාස වල බැතිමත් ජීවිතයක් ගත කිරීම වෙනුවෙන් රමළාන් මාසයේ දී විශිෂ්ඨ පුහුණු වීමක් ලබා ගන්නේය. මරණින් මතු ජීවිතයට මේ සියල්ල මඟින් ප්‍රයෝජනයක් ලබාගන්නේය.

උපවාසය කාලය තුළ මිනිසා බඩගින්නේ තැබීමෙන් අල්ලාහ්ට කිසිදු ප්‍රයෝජනයක් අත්නොවන්නේය. අල්ලාහ්ට එබඳු ආශාවක් ද නොමැත්තේය. උපවාසය ශිලය මිනිසාට ලබා දී මිනිසාව දහමට ලැදි කර ඒ ඔස්සේ ගැලවීම ලබා දීමයි උපවාසය තුළ දෙවිඳුන්ගේ බලාපොරොතු වන්නේ. ඒ සම්බන්ධයෙන් ශුද්ධ වූ අල් කුර්ආනය මෙසේ පවසයි.

**(නබි මුහම්මද්) මාගේ ගැත්තන් මා පිළිබඳව නුඹගෙන් විමසුවහොත් නියත වශයෙන්ම මා (ඔවුනට) ඉතා සමීපයැයි (පවසනු). ප්‍රාර්ථනා කරන්නා අමතන විට (ඔහුගේ) ප්‍රාර්ථනාවට මම පිළිතුරු දෙමි. එබැවින් ඔවුහු ම(ගේ ඇමතීම)ට සවන් දෙත්වා. තවද මා කෙරෙහි විශ්වාස කරත්වා. (මින්) ඔවුනට නිවැරැදි මඟපෙන්වීම ලබා ගත හැක.**

**(අල් කුර්ආන් 2:186)**

උපවාසය ඔස්සේ දුප්පතාගේ බඩගින්න දැනෙන්නට සලස්වනවා යන්න පැවසීම වැරැදිය. උපවාසය මනස පාලනය කිරීමට තුඩු දෙනවා යැයි පැවසීම නිවැරැදිය. මුස්ලිම්වරුන් වන අප උපවාසය රැකිය යුත්තේ දවස පුරා නිදා ගැනීමෙන් රාත්‍රි කාල වල අනුන්ට කරදර කිරීමෙන් නොවේ. රමළාන් මාසය සම්බන්ධයෙන් අනුන්ට වැරැදි මතයක් දැරීමට අප පාර නොකපා ශීලවන්ත භාවයකින් ආත්මය පාලනය කර ඒ ඔස්සේ රමළාන් මාසයේ ශ්‍රේෂ්ඨත්වය ලෝකයාට කියා පෑමයි සිදුවිය යුත්තේ.

A.J.K Ahmed

# නබි වදන් වලින් ස්වල්පයක්

## පිරිසිදු චේතනාව

නියත වශයනේම අල්ලාහ් ඔබලාගේ ශරීරය දෙස හෝ (බාහිර) හැඩරුව දෙස හෝ නොබලයි. එහෙත් ඔබලාගේ හදවත් හා ඔබලාගේ ක්‍රියාවන් දෙස බලන්නේය. (ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)

## යහපත් ගතිගුණ

නුඹලාගෙන් ශ්‍රේෂ්ඨයින් වන්නේ යහපත් ගතිගුණ ඇති අයයි.
(ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)

නියත වශයෙන්ම අල්ලාහ් නුඹේ යහපත් ගතිගුණ දෙකක් ගැන සතුටු වෙයි. 1 ඉවසීම 2 ඉක්මන් නොවී (සිතාබලා) කටයුතු කිරීම. (ග්‍රන්ථ: මුස්ලිම් )

මොළොක් බව කවරෙකුගෙන් ගිලිහෙන්නේ ද ඔහුගෙන් යහපත් සියලු දේ ගිලිහී යන්නේය. (ග්‍රන්ථ: මුස්ලිම්)

## අල්ලාහ්ව විශ්වාස කරන කෙනෙකුගේ වගකීම්

අල්ලාහ් ද අවසාන දිනය ද විශ්වාස කරන අය හොඳ දේම කතා කරත්වා! නැත්නම් නිහඬව සිටිත්වා! අල්ලාහ් ද අවසාන දිනය ද විශ්වාස කරන අය තම අසල් වැසියන් සමඟ උදාර අන්දමින් හැසිරෙත්වා! අල්ලාහ් ද අවසාන දිනය ද විශ්වාස කරන අය තම ආගන්තුකයින් සමඟ නිර්ලෝභීව හැසිරෙත්වා! (ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)

## මෙලොව සැපතින් ඈත් වීම

නුඹලාට වඩා (සැප පහසුකම්) අඩු අය දෙස බලන්න. නුඹලාට වඩා (සැප පහසුකම්) වැඩි අය දෙස නොබලන්න. නුඹලාට අල්ලාහ් ලබා දී ඇති දායාදයන් අවතක්සේරුවට ලක් නොකර සිටීමට මෙය කදිම මාර්ගයක් වන්නේය. (ග්‍රන්ථ: බුහාරි හා මුස්ලිම්)

රන් හා රිදී කාසී එළවර්ග වල හා රෙදි පිළිවලට වහල්වන්නා (මේවා හි ඇලී ගැලී සිටින්නා) විනාශ වුනේය. ඔහුට දෙන විට සතුට වෙයි. නොදෙන විට අසතුටු වෙයි. (ග්‍රන්ථය: බුහාරි)

නුඹලා වස්තුව නොගන්න (රැස්නොකරන්න). එසේ වස්තුව ලබා ගත්තොත් මේ ලෝකය පිළිබඳ තන්හාව ඇති අය ලෙස සැලකෙන්නෙහුය. (ග්‍රන්ථය: තිර්මිදි)

## නරක වචන කථා කිරීමේ තහනම

ඇණුම් පද කියන, ශාප කරන, නරක වචන පවසන අයහපත් දෑ කථා කරන අයෙකු විශ්වාසවන්තයකු බවට පත් නොවන්නේය.
(ග්‍රන්ථය: තිර්මිදි)

(වචනයෙන් හා ක්‍රියාවෙන්) සීමාව ඉක්ම වන්නෝ විනාශ වෙති
(ග්‍රන්ථය: මුස්ලිම්)

## අල්ලාහ්ගේ මැවීම් මත දිවුරීමේ තහනම

ප්‍රතිමා මත හෝ නුඹලාගේ දෙගුරුන් මත නුඹලා නොදිවුරන්න.
(ග්‍රන්ථය: මුස්ලිම්)

Zසනීර් අහමඩ්

---

E I D U L F I T H R

නෝම්බි අවුරුද්දට මුස්ලිම්වරුන් කියන්නේ "ඊදුල් ෆිත්ර්" යන්නය. දමිළ භාෂාව තම මව්බස කරගත් ඇතැම් මුස්ලිම්වරුන් නෝම්බි අවුරුද්දට කියන්නේ "පෙරනාල්" යනුවෙනි. මුස්ලිම් ජනයාට සමරන්නට ඇති දින දෙකකින් එකක් "ඊදුල් ෆිත්ර්" හා අනෙක "ඊදුල් අල්හාය". ඊදුල් අල්හා යනු හජ් උත්සවයයි. රමළාන් මාසය අවසන් වී මාස තුනකින් පසු හජ් උත්සවය ලැබෙන්නේය.

මෙහි වැරදි මතයක් තිබේ. නෝම්බි අවුරුද්ද යනු අලුත් අවුරුද්දක් නොවේ. හජ් අවුරුද්ද කියන්නේත් අලුත් අවුරුද්දක් නොවේ. මුස්ලිම්වරුන්ට සමරන්නට තිබෙන විශේෂ වූ දින දෙක සිංහල භාෂාව තම මව්බස කරගත් උදවියට පහසුවෙන් අවබෝධ කිරීමේ චේතනාවෙන් එසේ "අවුරුද්ද" යන වචනය අප පාවිච්චි කර ඇත්තෙමු. ඇත්ත වශයෙන්ම මුස්ලිම් ජනතාවගේ අලුත් අවුරුද්ද වන්නේ "මුහර්රම්" මාසය පැටගැන්මිය. මුහර්රම් යනු මුස්ලිම්වරුන්ගේ ජනවාරි මාසයයි. මුස්ලිම්වරුන්ටත් අන්‍යාගමිකයන්ට සේ මාස දොළොහක් තිබෙන්නේය.

ඊදුල් ෆිත්ර් සමරන මුස්ලිම් ජනයාට "අද විතරයිනේ" යන්න පවසමින් අරක්කු බීම තහනම්ය. "නෝම්බි මාසයේ හොඳට හිටියනේ, අද ඔක්කෝම කරලා ඉවර කරමු" යන්නෙන් පවසා සෑම ජරා වැඩක්ම කළ නොහැක. අප ආගමට ලැදි මුස්ලිම්වරුන් විය යුතුය. ඊදුල් ෆිත්ර් දවසේ ඉස්ලාම් දහමේම උගන්වා ඇති පරිදි කෑමට සුදුසු ආහාර බෙදා හරින්න. ඔබත් අලුත් වස්ත්‍ර ඇඳ අනෙක් දුප්පත් ජනයාට ද ඊදුල් ෆිත්ර් දවස වෙනුවෙන් අලුත් වස්ත්‍ර ලබා දෙන්න.

සතුටින් එම දවස ගත කිරීමට ඉස්ලාම් දහමේ සීමාව කඩ කිරීම අවශ්‍ය නොවන්නේය. උදෙන්ම මස්ජිදයට ගොස් ඊදුල් ෆිත්ර් වෙනුවෙන් වූ සලාතය ඉටුකරන්න. පස්වේල සලාතයද ඒදවසේ සැමදාමෙන් ඉටුකිරීමට අමතක නොකරන්න. සෑම මුස්ලිම්වරයෙකුම තමන්ගේ අසල් වැසියාට වෙනදට වැඩිය සැළකිල්ලක් දක්වන්න. පවුලේ නෑ හිතමිතුරන්ගේ නිවෙස්වලට යන්න. සතුටු වීම වෙනුවෙන් වූ දවසේ අනුන්ට කරදරයක් හෝ අපහසුතාවක් වන අයුරින් නොහැසිරෙන්න.

ලංකාවේ වෙසෙන සෑම ජනකොට්ඨාශයක්ම සාමයෙන් හා සමගියෙන් ඇතැම් පිරිස් වල උසිගැන්වීම් වලට නොරැවටී බුද්ධිමත්ව කටුයතු කිරීමට යා අල්ලාහ් අපට මගපෙන්වනු මැනව - යා අල්ලාහ් සෑම කෙනෙකුටම ඊදුල් ෆිත්ර් දවස සතුටු දායක දවසක් බවට පත් කරත්වා - යා අල්ලාහ් අපට විදදරා ගත නොහැකි බේදවාචක වලින් අපව ආරක්ෂා කරත්වා

සංස්කාරක මණ්ඩලය - ඇරයුම

# සාමාන්‍ය මුස්ලිම් නිවසක නෝම්බි ඇරීමට ගන්නා ආහාරය.

## රට ඉඳි



මෙය මුස්ලිම් නිවසක නෝම්බි ඇරීමට (අවසන්) කිරීමට ගන්නා ප්‍රධානතම ආහාරයකි. මුස්ලිම්වරුන් රට ඉඳි වලට ප්‍රධාන ස්ථනායක් ලබා දෙන්නේ මුහම්මද් නබි නායක තුමාණන්ගේ ජීවිතය තුළ ආහාරමය කටයුතු වල දී රට ඉඳි ප්‍රධාන ස්ථානයක් ගත් හෙයිනි. රට ඉඳි වලට දෙමළ භාෂවෙන් පසවන්නේ “ඊච්වේයි පලම්” යනුවෙනි. මෙම ඊච්වේයි පලම් හි රෝග නිවාරණ ශක්තියක් තිබෙන බව ද මුස්ලිම්වරුන්ගේ විශ්වාසයයි. එය අද වෛද්‍ය විද්‍යාවද සොයාගෙන ඇත.

## සහල් කැඳ



උදය කාලය පටන් නිහාරව සිටීම හේතුවෙන් ශරීර ශක්තිය වෙනුවෙන් කැඳ කෝප්පයක් ආහාරයට ගන්නේය. සහල් කැඳ සාදා ගමේ දුප්පත් මුස්ලිම් ගෙවල්වලට බෙදා දීම සඳහා මුස්ලිම් පල්ලිවලින් සංවිධානය කරන්නේය. මුස්ලිම් අයද මුස්ලිම් නොවන අයට මෙය බෙදා හරින්නේය. මෙම කැඳ කෝප්පයට දමිළ භාෂාවෙන් “කංජි” යැයි කියනු ලැබේ. මුස්ලිම්වරුන් අතර නෝම්බි මාසයේ කංජි විශේෂ තැනක් ගන්නේය.

**ඔබගේ අවධානයටයි**

**ඔබගේ පරිගණකයේ සිංහල අකුරු ඇතත් නැතත් පිවිසිය හැකි ලංකාවේ එකම ඉස්ලාමීය සිංහල වෙබ් අඩවිය**

**www.sinhalenislam.org**

**පිවිසෙන්න, කියවන්න, අධ්‍යයනය කරන්න, ඉස්ලාම් දහම සම්බන්ධයෙන් ඇති වැරදිමත දුරුකර ගන්න. සත්‍යය සොයා විවෘත සිතින් පැමිණෙන දෙනෙත් වලට හඳුන්වා දෙන්න. යහමග සොයා යන ගමනට ඔබත් අපට සහය වන්න.**

සංස්කාරක මණ්ඩලය



## හැකිනම් දායක වන්න.





- ✍ පාරේ කෙළ ගැසීමෙන් වළකිමු.
- ✍ පාරේ කසල දැමීමෙන් වළකිමු.
- ✍ රෝග බෝවන ස්ථාන පිරිසිදු කරමු.
- ✍ සැම විටම පදික වේදිකාවෙන්ම ගමන් කරමු.
- ✍ පාර මාරුවීමේ දී කහ ඉර භාවිතා කරමු.
- ✍ වාහන නැවතුම් ස්ථානයන්හි පමණක් වාහනය නවත්වමු.
- ✍ මහ පාරේ ගලක් තිබුණත් එය අයින් කරමු.



- ✍ පොදු ස්ථාන වල විනීතව හැසිරෙමු.
- ✍ සැමටම ආදරය කරමු.





**Azwer** Phone Repair

**ඔබගේ ජංගම දුරකථන අලුත්වැඩියා සඳහා විමසන්න.** **දු.අං: 0772728877**

**202/34, Mohideen Masjid Road, Maredana. Colombo.**



අල්ලාහු අක්බර්// - අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය.

අෂ්හදු අන් ලාඉලාහා ඉල්ලල්ලාහ්// - අල්ලාහ් හැර කිසිදු දෙවියෙක් නැති බව මම සාක්ෂි දරමි.

අෂ්හදු අන්න මුහම්මදර් රසූලල්ලාහ්// - මුහම්මද් අල්ලාහ්ගේ වක්තෘවරයාණන් බව මම සාක්ෂි දරමි.

හයියාඅ ලස්සලාහ්// - සලාතයට යුහුසුළු වන්න.



හයියඅ ලල් ෆලාහ්// - විජයග්‍රහණයට යුහුසුළු වන්න



අල්ලාහු අක්බර්// - අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය.

ලාඉලාහා ඉල්ලල්ලාහ් - අල්ලාහ් හැර අන් දෙවියෙක් නැත.

# මුස්ලිම් පල්ලියේ කෑගහන්නේ ඇයි?

සෑම මුස්ලිම්වරයෙකුටම දවසකට පංචකාල නැමදුම ඉටුකිරීම අනිවාර්‍යය. මිනිසාගේ අමතක වීමේ ස්වභාවය හේතුවෙන් ඇතැම් මුස්ලිම්වරුන් නැමදුම අමතක කරති. ස්වර්ග රාජ්‍යය තමන් පමණක් අත්කර ගැනීම ඉස්ලාම් දහම අනුමත නොකරයි. ඒ හේතුවෙන් සෑම මුස්ලිම් පල්ලියකින්ම සාමුහික ජයග්‍රහණය සඳහා කෑගසා කැඳවුම් කරයි. පසුව නැමදුම ඉටුකරන්නේය. ඒ සඳහා පල්ලියක් අවශ්‍ය වන්නේය. මෙම කැඳවුම් ක්‍රමය අලුතින් ආරම්භ කළ දෙයක් නොවේ. අල්ලාහ්ගේ නාමය මුළු ලොවටම රැව්දිය යුතුයි යන්න චේතනාවෙන් අල්ලාහ් විසින් මුහම්මද් නම් මුස්ලිම්වරුන්ගේ අවසාන දිව්‍යසිවරයාට හඳුන්වා දෙන ලදී. මුස්ලිම්වරුන්ට කැමති වේලාවකට මෙම කැඳවුම කළ නොහැක. කිසිදු පල්ලියකින් මෙය පටිගත කර විකාශනය කරන්නේ නැත. මෙම කැඳවුම් කළ හැක්කේ දෙවිදුන් විසින් අනුමත කළ කාලවේලාවන් තුළ පමණී. මෙලොව මවා පාලනය කිරීමට හැකියාව ඇති එකම සුදුස්සා අල්ලාහ් හැර වෙන දෙවියෙකු හට නොමැති බව ලෝකයාට ප්‍රකාශ කිරීමේ පළමු අදියරය මෙය වන්නේය. මෙම කැඳවුම මුස්ලිම්වරුන්ට පමණක් අදාල වන්නේ නැත. සෑම මුස්ලිම් පල්ලියකින්ම පස්වෙල මෙම කැඳවුම කරන අවස්ථාවේ එම ශබ්දය මුස්ලිම් නොවන ඔබ කණ වැකුණෝ නම් අල්ලාහ් දෙවිදුන් පිළිබඳ මුස්ලිම් සමාජය ඔබට හඳුන්වා දුන් බවත් ඔවුන් වෙනුවෙන් මම සාක්ෂි වන්තයෙකු බව සිහිපත් කරගන්න. මරණින් මතුව අල්ලාහ් දෙවිදුන් ඉදිරියේ අප සියලු දෙනා පෙනීසිටින අවස්ථාවේ ඔබ මුස්ලිම් සමාජය වෙනුවෙන් සාක්ෂිකරුවෙකු වන්න. එය කුමක් සඳහා ද යත් **නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙන දෙවියෙකු නැත** යන්න මුස්ලිම් සමාජය ඔබට පැවසුහෙයින්. මෙය සෑම මිනිසෙකුට තමාගේ දෙවියා කවුරුන්ද යන්න හඳුනාගැනීමට හොඳම අවස්ථාවක් යන්න සිතිය යුතු මිස කිසිවෙකුටවත් කරදරයක් යැයි නොසිතිය යුතුයි

**ෆස්මිනා**

# ලංකාවේ මුස්ලිම්වරු

II කොටස

## සුප්‍රසිද්ධ යෝනක වෛද්‍යවරයා

මීරා ලෙබ්බේ මේස්තිරියාර් සේහාදි මරික්කාර් (මත්තව්වම් මීරා ලෙබ්බේ මේස්තිරියාර් සෙයිනු අබ්දුල් කාදර් මරික්කාර්) සුප්‍රකට වෛද්‍යවරයෙකි. හෙතෙම සාලිය සෙබළුන්ගේ ද කොළඹ ඕලන්දයන් යටතේ සේවය කළ යෝනක රෙජමේන්තුවේද වෛද්‍යවරයා වශයෙන් පත් කරනු ලැබුවේය. 1806 දී බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රේෂ්ඩාධිකරණය යටතේ පැවැති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ස්වදේශීය අධිකාරි ධුරය මොහුට පැවරිණි. ආණ්ඩුකාර නෝර්ත් සාමිගේ අණ පරිදි සම්පාදනය කරන ලද වර්ෂ 1806 අගෝස්තු 1 වන දින දරණ මෝර්ස් හෙවත් මුහමදිකයන් සම්බන්ධ විශේෂිත නීති පද්ධතියට අත්සන් තැබීමේ ගෞරවය හිමි වූවන්ගෙන් මොහුද කෙනෙකි. 1823 දී යෝනකයන්ගේ නායකයා හැටියට ද බේරුම්කරු හැටියට ද පත් කරනු ලැබූ ඔහු 1840 පෙබරවාරි මස 25 වැනි දින වන්මාන්තර ගත විය.

ලංකාවේ අග්‍ර විනිශ්චකාරයාද රාජ සභාවේ නායකයා ද වූ සර් ඇලෙක්සැන්ඩර් ජොන්සන් විසින් සම්පාදනය කරනු ලැබ 1834 ජුනි මස 19වන දින රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවට පරිත්‍යාග කළ මීරා ලෙබ්බේ මේස්තිරියාර් සෙහාදි මරික්කාර්ගේ රූපය කොළඹ කෞතුකාගාරයට යැව්වේය" එය අදත් එහි ප්‍රදර්ශනය කෙරෙයි" (සටහන් අංක සී. 448)

යෝනක වෛද්‍යවරයාගේ පෙළපත පහත දැක්වෙන අයුරු විහිද යන්නේය:

1 සුළු ආසියාවේ කෝනියා ප්‍රදේශයේ සුල්තාන් ආබිදීන් ගේ පුතුණුවන් වූ ජමාල්දීන් කුමාරයා කි.ව 800 දී බේරුවලට පැමිණ පදිංචි වී එහි වෛද්‍ය වෘත්තියෙහි නියුක්ත වූයේය. ඒ iii වන දප්පුල රජුගේ කාලයේදීය. ඒ රජතුමා විසින් වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවා තිබිණි.

2 වෛද්‍ය පෙරිය මුදලි මරික්කාර් (ක්‍රි.ව 1016) ඉන්දියාවෙන් ලංකාවට පළමුවරට පේෂකර්මාන්තකරුවන් හඳුන්වා දුන්නෙකි. (මේ පේෂකාර්මිකයෝ වත්මන් සලාගම ග්‍රෝත්‍රයේ මුතුන් මිත්තෝය.) ඒ නිසා එවකට සිටි සිංහල රජු විසින් ඔහුට රාජ්‍ය සම්මානයක් පිරිනමන ලදී.

3 වෛද්‍ය මින්නා මරික්කාර් බස්තාමියාර් (ක්‍රි.ව 1515) පෘතුගීසි රාජකීය වෛද්‍යවරයා හැටියට පත් කරන ලද්දේය.

4 වෛද්‍ය උදුමා ලෙබ්බේ මේස්තිරියාර් සේහාදි මරික්කාර් මේස්තිරියාර් (ක්‍රි.ව 1640) ඕලන්ද පාලනය යටතේ රාජකීය වෛද්‍යවරයා වශයෙන් සේවය කළේය.

5 වෛද්‍ය බස්තාමියාර් ලෙබ්බේ මරික්කාර් මීරා ලෙබ්බේ මේස්තිරියාර්: ඕලන්ද රාජකීය වෛද්‍යවරයෙකි. ඔහු තත්ත්වයෙන් උසස් කොට සාලිය භට සේනාවේ වෛද්‍යවරයා වශයෙන් කොළඹට යවන ලදී.

6 වෛද්‍ය මීරා ලෙබ්බෙයි මේස්තිරියාර් සේහාදි මරික්කාර් සුප්‍රසිද්ධ යෝනක වෛද්‍යවරයාය.

යෝනක වෛද්‍යවරයාගේ පවුල පිළිබඳ විස්තර දැක්වෙන සටහනක් මහා මුදලියාර් ඒබ්‍රහම් ද සේරම්ගේ කුළ ලේඛන පුස්තකයෙහි අන්තර්ගත වෙයි.

මීරාලෙබ්බෙයි මේස්තිරියාර් සේහාදි මරික්කාර්, මරදානේ ජුම්මා මස්ජිදය පිහිටා ඇති ඉඩමේ හිමිකරු වූ බස්තාමියාර් ලෙබ්බේ මරික්කාර් මීරා ලෙබ්බේ මෙස්තිරියාර්ගේ කුලුදුල් පුත්‍රයාය.
ඉහත කී මේස්තිරියාර් ඕලන්ද බ්‍රිතාන්‍ය අණ්ඩුව යටතේ නම් දැරූ වෛද්‍යවරයෙකු වශයෙන් සේවයෙහි නියුක්තව සිටියේය. මරදාන මස්ජිදය පිහිටි ඉඩමේ ඔහු දිගු කලක් තිස්සේ කිසිදු ආරවුලකින් තොරව බුක්ති විඳීම නිසා 1744 දී ඔහුට එය මුස්ලිම්වරුන්ගේ යහපත සඳහා සින්නක්කර ඔප්පුවකින් හිමිකරගත හැකි විය. දැනට මරදානේ පොලිස් ස්ථානයටත් ඊට මදක් ඔබ්බෙන් ඇති දෙමටගොඩ පාරටත් අතර පිහිටි ඉඩම ද ඔහු සන්තකව තිබිණි.



එදා මරදාන මස්ජිදය



මරදාන නගරය



ඔහු මේ ඉඩම් දෙක තමන් සන්තක කොට ගත්තේ සිය වෛද්‍ය වෘත්තියට අවශ්‍ය බෙහෙත් වර්ග වගාකර ගැනීම සඳහාය. කල් යෑමේදී ඔහු මරදානේ වත්මන් පොලිස් ස්ථානය පිහිටි ඉඩමට යාබදව ගොඩනැගිල්ලක් ඉදිකොට එහි සිය පවුල ද සමඟ වාසය කළේය. මේ ගොඩනැගිල්ල කාලයාගේ ඇවෑමෙන් සේහා මරික්කාර් (සෙයිහු අබ්දුල් කාදර් මරික්කාර්) ට අයිති විය. ඉහත කී මේස්තිරියාර් ඔහුගේ ගොඩනැගිල්ල ඉදිරිපස පිහිටි භූමියෙහි මස්ජිදයක් ඉදි කළේය. මුලදී එය ඔහු විසිනුත් ඔහුගේ පවුලේ අය විසිනුත් වැඩි වශයෙන් පාවිච්චි කරන ලද්දේ සලාතය සඳහාය. පසුව අසල්වැසි මුස්ලිම් ජනතාව විසින් මස්ජිදය වඩා විශාල කොට ඉදි කරන ලද්දේය. දැන් අපට දක්නට ලැබෙන මරදාන ජුම්මා මස්ජිදය එයයි.

මරදානේ සීමත් මාවතේ පිහිටි කුඩා මස්ජිදය පසු කලකදී මහා මස්ජිදයේ ජමාඅත් අයත් සමහරුන් විසින් නිර්මාණය කරන ලද්දේය. (ඔප්පු අංකය: 2032: දිනය: 12.8.1856 නොතාරිස් නැත: ජ්.ඩබ් ස්ටොක්)

කොළඹ නගරයෙහි 1505 දී මස්ජිද් දෙකක් ද 1834 වන විට මස්ජිද් 17 ක් ද විය. සර් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් 1827 පෙබරවාරි මස 3 වැනි දා රාජ්‍ය ලේකම්ට යැවූ ලිපියෙහි යෝනක වෛද්‍යවරයා ගැනත් ඔහුගේ පවුල ගැනත් මෙවැනි සඳහනක් කර ඇත. මහා බ්‍රිතාන්‍යයේ හා අයර් ලන්තයේ රාජකීය ආසියාතික සංගමයේ වාර්තාවේ. Transactions of the Royal Asiatic Society of Great Britain and Ireland- 1වැනි වෙළුම 537 වැනි පිටුවේ මෙසේ දැක්වෙයි.

“ලංකාවේ පළමුවැනි පේසකාරයන් පිරිස” අභිමුඛ ඉන්දියානු වෙරළෙන් ගෙන්වා මෙරටට හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් එවකට බාබරින්හි විසූ මහමදික වෙළෙන්දෙකුටත් ඔහුගේ පාරම්පරකයින්ටත් යම් යම් වරප්‍රසාද හා අයිතිවාසිකම් පවරා දීම සඳහා ලංකාවේ සිංහල රජතුමකු විසින් අවුරුදු හයසීයකට හෝ හත් සීයයකට පෙර පිරිනමන ලද අති පුරාණ අපූර්ව තඹ සන්නසක පිටපතක් මා සන්තකයේ ඇත්තේය. මේ වෙළෙන්දාගේ අඛණ්ඩ පාරම්පරිකයෝ සිය මුතුන්මිත්තන්ට රටේ පෞරාණික සිංහල රජය විසින් පවරා දෙනු ලැබ ඉන් අනතුරුව අනු පිළිවෙලින් රටේ ඇති වූ පෘතිගීසින් ඕලන්ද හා ඉංග්‍රීසි අණ්ඩුව විසින් ද තහවුරු කෙරුණු එකී වරප්‍රසාද වලින් කොටසක් යථොක්ත සන්නයේ බලය පිට බ්‍රිතාන්‍ය අණ්ඩුව යටතේ අදත් බුක්ති විඳිති. මේ පවුලේ ප්‍රධානියා ශ්‍රේෂ්ඨාධිකරණයේ පාලනය යටතේ පැවැති වෛද්‍ය දෙපාර්තමේන්තුවේ දේශීය අධිකාරීවරයා වශයෙන් වර්ෂ 1806 දී මවිසින් පත් කරන ලදී. ඔහු දිවයිනේ දක්ෂතම දේශීය වෛද්‍යවරයෙකු වශයෙන් ස්වදේශිකයින් විසින් සැලකුණු අතර අඩු වශයෙන් සිය පවුලේ එක් කෙනෙකුවත් වෛද්‍ය වෘත්තියේ නියැලීම සිරිතක්ව පැවැති අවුරුදු හත්-අට සීයයක කාලය තුළ සිය පවුලට අයත්ව තිබුණු හොඳම දේශිය වෛද්‍ය ග්‍රන්ථ සමූහයක් ද ඔහු සන්තකව තිබුණේය. එම දිවයිනේ විසූ මහමදික දේශිය වෛද්‍යවරුන් විසින් අනාදිමත් කාලයක් තිස්සේ ඖෂධ සඳහා භාවිතා කරන ලද සියලුම පැළෑටි පිළිබඳ සවිස්තර වාර්තාවක් මා වෙත සපයන ලද්දේය. මේ පැළෑටි වර්ගත් ආහාරය හා වෙළෙඳ ව්‍යාපරය සඳහා අවශ්‍ය එළවළු ඇතුළු වෙනත් පැළෑටි වර්ගත් වගා කිරීම හා සංවර්ධනය කිරීම මහා රාජෝත්තමයාණන් ආණ්ඩුවේ වැදගත් අරමුණු වලින් එකක් වූ අතර වර්ෂ 1810 දී මගේ යෝජනාවක් අනුව ලංකාවේ රාජකීය උද්භිද උද්‍යානයේ පිට්ටුවන ලද්දේ මේ අරමුණු මුදුන් පමුණුවා ගනු පිණිසය.

ඒ කාලයේ සිටි යෝනක වෛද්‍යවරුන්ට වෛද්‍ය ක්ෂේත්‍රයේ හා දර්ශනවාදය පිළිබඳ තිබුණු පෘථුල ඥානය ගැන සර් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් තම ලිපියෙහි තව දුරටත් මෙසේ ද සඳහන් කරයි.

“ලංකාවට හදුන්වා දෙන ලද ප්‍රධාන පෙළේ අරාබි වෛද්‍ය කෘතීන් අතර අවිසින්නාගේ කෘතිය එකකි’ ඔවුහු ඇරිස්ටෝටල්, ප්ලේටෝ, යුක්ලිඩ්, ගැලන් හා ටොලමි යන අයගේ කෘතිවල අරාබි පරිවර්තනද හඳුන්වා දුන්හ. මා ලංකාවේ සිටිය දී එම ග්‍රන්ථ වල ප්‍රධාන කොටස් මහමදික




ආගමික වියතුන් හා වෙළෙඳුන් විසින් මා වෙත ගෙන එන ලදී. සිය මුතුන්මිත්තන් විසින් බග්දාදයෙන් සපයා ගන්නා ලද මේ මුල් කෘති අවුරුදු සිය ගණනක් මුළුල්ලේ ලංකාවේ සිය පවුල් සන්තකයේ තිබී පසුව ඔවුන්ගේ ආපදා අවස්ථාවල ලංකාව හා නැගෙනහිර දිග දූපත් අතර වෙළෙඳාමෙහි නියුක්තව සිටි වෙළෙඳුන් පිරිසකට සැහෙන මිලකට විකුණන ලද බව ඉහත කී මහමදික ආගමික වියතුන් වෙළෙන්දෝ ප්‍රකාශ කළහ. මවිසින් සදහන් කළ කෘතීන්ගෙන් උපටාගන්නා ලද කොටස් අන්තර්ගත විශාල වෙළුම් තුනක් ආසියාවේ බෙහෙවින් කීර්තිමත්ව සිට අවුරුදු විස්සකට පමණ උඩ දී ලංකාවෙහි දී මියගිය මහමදික ආගමික වියතෙකු විසින් මට තෑගි කරන ලද්දේය. ලංකාවේ සිංහල හින්දු හා මහමදික ජනතාවගේ ඉතිහාසය- ආගම- සිරිත් විරිත් හා සාහිත්‍ය ද පිළිබඳ සිංහල- පාළි- දමිළ හා සංස්කෘත භාෂාවන්ගෙන් ලියැවුණු සැලකිය යුතු වියදමක් දරා මවිසින් රැස්කරගෙන තිබුණු පොත් 500 ත් 600 ත් අතර ගණනක් සමඟ මෙකී පොත් කාණ්ඩ 3 ද මා එංගලන්තය බලා ගිය 'ලේඩි ජේන් දුන්දාස්' නම් නැවේ දී නැති වුයේය.''

වර්ෂ 1800 දී පමණ මෙම යෝනක වෛද්‍යවරයා මරක්කල පල්ලියෙන් එය පිහිටි ඉඩෙමෙත් බාරකරු වශයෙන් සිටියේය. ජමාත්හි ප්‍රකට පුද්ගලයන්ගේ භූමදාන කටයුතු සදහා ඔහු මේ වත්ත කොටස්වලට බෙදුවේය. ඔහුගේ පවුලට අයත් වූ කොටසේ අංක 41 දරණ සුසාන භූමිය වසා දැමිය යුතුයයි. 1873 මැයි මස 21 වන දින දරණ ආඥාවක් මගින් රජය නියෝග කළ නමුත් මේ වෛද්‍යවරයාගෙන් පැවතෙන්නෝ දිගටම ඒ නියෝගය කඩ කරමින් තම පවුල් වල මිය යන්නවුන්ගේ මෘත ශරීර මිහිදන් කිරීම සඳහා මේ භූමිය පාවිච්චි කළෝය. රජයේ නියෝග කඩ කිරීම ගැන ඔවුනට අධිකරණයෙහි නඩු පවරා දඩ ගසන ලදී. ඔවුන්ගෙන් සමහරෙක් තම පවුල්වල භූමදාන කටයුතු සඳහා මේ ඉඩම පාවිච්චි කිරීමට රජයේ අනුමතිය අයදමින් සිටියේ ය. ඊට ඉඩදීම සඳහා රජය විසින් නැවත නීතියක් පනවා එය 1882 ජුනි මස 16 වන සිකුරුදා රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නමුත් ඒ වන විට මොවුන්ගේ පවුල් වල මිහිදන් කටයුතු සඳහා කුපියාවත්තේ සොහොන් බිම පාවිච්චි කෙරුණු හෙයින් යථෝක්ත නීතිය අහෝසි කරන ලද්දේය. ඉන් අනතුරුව මේ පවුලේ සුසාන භූමියෙන් අඩක් **ලංකා රජයේ දුම්රිය දෙපාර්තමේන්තු විසින් පවරා ගැණින**. දැන් එහි බෝ රුකක් දක්නට ලැබෙයි. මස්ජිද් වත්තේ සියඹලා ගසක් යට වූ මේ යෝනක වෛද්‍යවරයාගේ සුසානය සමතලා කර දමන ලදුව ඒ ස්ථානය ජමාඅතයේ ප්‍රයෝජනය සඳහා රිය ගාලක් බවට පරිවර්තනය කරන ලද්දේය.

**1931 දී මේ වෛද්‍යවරයාගේ මුණුබුරකු වූ වෛද්‍ය බස්තාමියාර් අබ්දුල් කරීම්ගේ මෘත දේහයන් 1955 දෙසැම්බර් මස 27 වැනි දින වෛද්‍යවරයාගෙන් පැවතෙන්නෙකු වූ නීතිඥ එස්. ඩී. එම් බුර්හාන් මහතාගේ මෘතකලේබරයත් ඔවුන්ගේ ආවේණික උරුමය අනුව මේ භූමියෙහි මිහිදන් කිරීමට වෑයමක් දරණ ලද නමුත් එය ව්‍යාර්ථ වී ගියේය. වෛද්‍ය කලානිදි නාෆික් බුර්හාන් ද යෝනක වෛද්‍යවරයාගෙන් පැවැතෙන්නකි. කෘතහස්ත වෛද්‍යවරයෙකු වශයෙන් ප්‍රකටව සිටි මොහු FRCS වෛද්‍ය උපාධිය ලැබූ ප්‍රථම ලාංකික මුස්ලිම්වරයා වීමේ ගෞරවයට හිමකම් ඇත්තෙකි. ඒ.සී අබ්දුල් කාදර් හා ඒ.සී ජමාල්දීන් යන දෙදෙනා යෝනක වෛද්‍යවරයාගේ මුණුබුරෝය. මරදාන මස්ජිද් පාලක සභාවේ ලේකම් වශයෙන් අවුරුදු 35ක් පමණ දීර්ඝ කාලයක් සේවය කළ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ එස්.ටී බුර්හාන් මහතා ද මොවුගෙන් පැවතෙන්නෙකි. ශ්‍රේෂ්ඨාධිකරණ නිතීඥ මොහියියදීන් බුර්හාන් හා සමස්ත ලංකා තරුණ මුස්ලිම් සංගමයේ ආර්ම්භක සාමාජිකයෙකු ද තෙළෙස්වැනි සභාපති ද වූ මර්සූක් බුර්හාන් යන දෙදෙනා ද මේ වෛද්‍යවරයාගෙන් පැවතෙන්නෝය.**

**කුර්ෂිඩ් අහමඩ්ගෙන් ස්තූති** MICH

දුර්ලභ ඡායා රූප



**ඒ.එම් වාපිච්චි මරික්කාර් මහතා**



**පී.එම් උම්බිච්චි මහතා**

# දීප ව්‍යාප්ත මහා රචනා තරඟය

# 2012

මහ උත්තමයාණන් වූ මුහම්මද් නබි නායක තුමන්ගේ ජීවන චරිතය ලාංකීය සමාජයට දැනගැනීම පිණිස රචනා තරඟය මෙවරත් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත්තෙමු. ජයග්‍රාහකයින්ට මුදල් ත්‍යාග සමග වටිනා සහතික ප්‍රත්‍රයක් ද පිරිනමන්ට අදහස් කරන්නෙමු.

## තරඟ විස්තර

මාතෘකාව : **මිනිස්කමින් ලොව දිනූ උතුම් මුහම්මද් නබි තුමාණෝ**

## තරඟ කොන්දේසි

✍ සියලුම තරඟකරුවන් මුස්ලිම් නොවන සහෝදර සහෝදරියන් විය යුතුය.

✍ අන්තර්ගත විය යුතු මූලික කරුණු (උදාහරණ සහිතව)

*සාම දූතයෙකු ලෙස ජීවත් වීම.
*රාජ්‍ය නායකයෙකු ලෙස ජීවත් වීම.
*යහපත් ස්වාමි පුරුෂයෙකු ලෙස ජීවත් වීම.
*අවස්ථාවට උචිත පරිදි සෙන්පතියෙකු ලෙස සිටීම.
*මෛත්‍රී ගුණ ඇත්තෙකු ලෙස ජීවත් වීම.

✍ පැහැදිලි අත් අකුරින් වචන 1000-1500 අතර රචනාවක් විය යුතුය.

✍ ස්වනිර්මාණයක් විය යුතුය.

✍ නම හා ලිපිනය මෙන්ම දුරකතන අංකය පැහැදිලිව සඳහන් කරන්න.

✍ 2012 දෙසැම්බර් 31 වන දිනට පෙර අප වෙත ලැබීමට සලස්වන්න.

✍ පාසැල් ළමුන්ගේ නිර්මාණ විදුහල්පති සහතික කළ යුතුය.

✍ තරඟ විනිශ්චය සංවිධායක මඩුල්ලේ විද්වතුන් විසින් කරනු ලබන අතර ඔවුන්ගේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ.

## ත්‍යාග

| | | |
|---|---|---|
| ප්‍රථම ස්ථානය | - | රු 20,000 |
| දෙවන ස්ථානය | - | රු 15,000 |
| තුන්වන ස්ථානය | - | රු 10,000 |
| සැනසිලි ත්‍යාග | - | 10 ක් |

ඔබගේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න. ලියුම් කවරයේ කෙළවර "රචනා තරඟය" යන්න සඳහන් කිරීමට අමතක නොකරන්න.

ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදය (FRCS)
තැ.පෙ: 1989, කොළඹ.
දු.අංකය: 0113 091 951 - 0115 690 717
ඊමේල්: frcs.org@gmail.com
වෙබ්: www.sinhalenislam.org



පුසගිය මාසයේ ඇරයුම පවුලේ උදව්ය මෙන්ම ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදය ඒකාබද්ධව පවත්වන ලද පොත් ප්‍රදර්ශනය කොළඹ අලුත් කඩේ උසාවි සංකීර්ණය අසල පැවැත් විණ. පළාත් සභා මන්ත්‍රීවරුන් හා නාගරික මන්ත්‍රීවරුන් මෙන්ම විනිසුරුවරුන්, නීතිඥයින් මෙන්ම තවත් බොහෝ පිරිසක් සහභාගී වූ අතර මෙහදී අල් කුර්ආන් සිංහල පරිවර්තනයට විශේෂ ඉල්ලුමක් පැවතීම සුවිශේෂ කරුණකි.

## මාංශ ආහාරය පිළිබඳ හින්දු, කිතුනු, බෞද්ධ හා ඉස්ලාමීය ඉගැන්වීම්




ආගමික හා සංස්කෘතික අධ්‍යයන සංසදය(FRCS)
තැ.පෙ: 1989, කොළඹ.
දු.අ: 0774 131 132 - 0115 690 717






අප විසින් ප්‍රකාශයට පත්කරන ලද මෙම කෘතිය ලබා ගැනීමට විමසන්න.
0115 690 717